**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #June11**

කිසියම් පුවතක් සම්බන්ධ නිවැරදි කිරීම් ප්‍රමාණවත් කාලයක් තුළ සිදුකළ යුතු අතර, ඒවා අදාළ පුවත පළවූ පිටුවට සමාන පිටුවක හෝ ඊට ආසන්න ස්ථානයක පළ කළ යුතුය. මෙය ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් නිකුත් කළ පුවත්පත් ආචාර ධර්ම සංග්‍රහයේ දැක්වෙන මාධ්‍ය ආචාර ධර්මයකි. දිවයින පුවත්පත මගින් මින් පෙර පළ කරනු ලැබූ විකෘති කළ, නොමඟ යවන සුළු හෝ සාවද්‍ය ප්‍රවෘත්තීන් කිහිපයක්ම අප විසින් පෙන්වා දී ඇත්තෙමු. කෙසේ වෙතත් මෙම එකදු පුවතක් සම්බන්ධයෙන් හෝ නිවැරදි කිරීමක් සහ/හෝ කණගාටුව දැක්වීමක් පළ කිරීමට දිවයින පුවත්පත උත්සුක නොවූ බවද නිරීක්ෂණය කළෙමු. මෙසේ එක් වරක් සාවද්‍ය/නොමඟ යවන සුළු ප්‍රවෘත්ති පළ කිරීමෙන් සහ දෙවෙනුව ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක්/කණගාටුව දැක්වීමක් පළ කිරීමට අපොහොසත් වීමෙන් ලෙසින් දෙයකාරයකින් දිවයින පුවත්පත මාධ්‍ය ආචාර ධර්මයන් කඩ කොට ඇත.

පසුගිය (9) දින දිවයින මගින් පළ කරන්නට යෙදුණු සාවද්‍ය ජාත්‍යන්තර ප්‍රවෘත්තියක්ද මේ දිනවල සමාජ ජාලයන් ඔස්සේ සංසරණය වෙයි. ඒ සම්බන්ධයෙන් හෝ දිවයින පුවත්පත නිවැරදි කිරීමක් සහ කණගාටුව ප්‍රකාශ කිරීමක් පළ කරනු ඇතිද? ඒ සම්බන්ධව පාඨකයින් විමසිල්ලෙන් බලා හිඳින බව පමණක් දිවයින පුවත්පතට සිහිපත් කරමු.